# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,686 - 2010 දෙසැම්බර් මස 24 වැනි සිකුරාදා - 2010.12.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 2366 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 2366 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 2368 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 2371 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන **විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 දෙසැම්බර් මස 31 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 දෙසැම්බර් මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2011**

වසර දෙකක කාලයක් සඳහා පහත දැක්වෙන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීමට මිළ ගණන් 2011.01.07 වැනි දින පස්වරු 2.00 දක්වා අදාල පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලවලදී භාරගනු ලැබේ. ඒ සඳහා වන විස්තර සහ ඉල්ලුම් පත්‍ර කාර්යාල වේලාවන් තුල අදාල පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයෙන් සහ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙන් ආපසු නොගෙවන රු. 250 (රුපියල් දෙසිය පනහක) මුදලක් ගෙවා 2011.01.07 වැනි දින මධ්‍යාහ්න 12.00 තෙක් ලබා ගත හැක.

*උපලේඛනය*

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය* | *අයැදුම්පත් හා අනෙකුත් විස්තර ලබා ගත හැකි ස්ථාන* | *මිළ ගණන් භාර ගැනීම* |
|---|---|---|---|---|
| ඌව පළාත | මොණරාගල | බුත්තල | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (ඌව පළාත) දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය, මොණරාගල. | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (ඌව පළාත) බදුල්ල. |

කවරයේ ඉහල වම් කෙළවරෙහි "ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය කුලියට ගැනීම" (ස්ථාන නාමය) යනුවෙන් සඳහන් කරන ලද මිළ ගණන් සපුරාලිය යුතු අවශ්‍යතා විස්තර ද සහිතව 2011.01.07 දින පස්වරු 2.00 ට පෙර ලැබෙන සේ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම කළ හැකිය.

සර්වේයර් ජනරාල්,

කොළඹ 05, කිරුල පාර,
සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී ය.

12-760

---

# බඩු බාහිරාදිය විකිණීම

**මහෙස්ත්‍රාත් අධිකරණය - බදුල්ල**

බඩු බාහිරාදිය වෙන්දේසියේ විකිණීම

බදුල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ වශයෙන් ඇති රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් පෑමක් නොකළ පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ වර්ෂ 2011 ජනවාරි මස 08 වැනි දින පෙ.ව. 9.30 සිට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුය.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත මෙදින පෙ.ව. 9.00 සිට පෙ. ව. 9.30 වන තෙක් භාණ්ඩ පරීක්ෂා කළ හැකිය.

03. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවන් හි දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ සම්පූර්ණ අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියේදී මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා එවේලේම මුදල් ගෙවා එකී භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

05. භාණ්ඩ ගැණුම්කරුවන් ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතුය.

වයි. ආර්. බී. නෙලුන්දෙනිය,
මහෙස්ත්‍රාත් හා අතිරේක දිසා විනිසුරු,
බදුල්ල.

2010 දෙසැම්බර් 07 වැනි දින,
බදුල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසි ලැයිස්තුව**

| | *නඩු අංකය* | *නඩු භාණ්ඩය* |
|---|---|---|
| 01. | ඒආර් 156/10 20039 | ගෑස් සිලින්ඩර් 01 |
| 02. | 2540 | LAFF ගෑස් සිලින්ඩර 01 |
| 03. | ඒආර් 591/06 | එරික්සන් වර්ගයේ ජංගම දුරකථන 01 |
| 04. | ඒආර් 931/08 | නොකියා ජංගම දුරකථන 01 |
| 05. | 77761 | ඉරුම් මේස 01, රවුම් කියත් තල 01, ෆාම් මාස්ටර් වර්ගයේ අත් ට්‍රැක්ටර් එන්ජින් 01 |

| | නඩු අංකය | නඩු භාණ්ඩය |
|---|---|---|
| 06. | 92544 | ඉරුම් මේස 01, රවුම් කියත් තල 01, 9925 ෆෑන් වර්ගයේ අත් ට්‍රැක්ටර් 01 |
| 07. | 6080 | ඉරුම් මේස 01 යි, රවුම් කියත් තල 01යි ඩීසල් එන්ජින් 01 |
| 08. | 4479 | කියත් තල 01 |
| 09. | 95573 | කියත් තල 01 |
| 10. | 98360 | ඇලුමිනියම් කම්බි රෝල් 01 |
| 11. | ඒආර් 847/06 | විදුලි පන්දම් 01 |
| 12. | අංක රහිත | කියත් තල 02 |
| 13 | අංක රහිත | උදළු තොගයක් |
| 14. | අංක රහිත | සවල් තොගයක් |
| 15. | අංක රහිත | බියර් කේස් තොගයක් |
| 16. | අංක රහිත | ටයර් 10 ක් පමණ |
| 17. | - | ටයර් 04 (මහෙස්ත්‍රාත් නිල රථයෙන් ඉවත් කරන ලද) |
| 18. | - | ටයර් 04 (සිවිල් අභියාචන විනිසුරු තුමාගේ නිල රථයෙන් ඉවත් කරන ලද) |
| 19. | අංක රහිත | විවිධ ප්‍රමාණයේ වීදුරු තොගයක් |
| 20. | අංක රහිත | විවිධ ප්‍රමාණයේ ඇලුමිනියම් මුට්ටි කීපයක් |
| 21. | අංක රහිත | බාල්දි 10 ක්පමණ |
| 22. | අංක රහිත | ප්ලාස්ටික් ජොග්ගු, බේසම් කිහිපයක් |
| 23. | අංක රහිත | කලගෙඩි 02 ක් |
| 24. | අංක රහිත | හිස් බැරල් තොගයක් |
| 25. | අංක රහිත | හිස් බූලි/කෑන් තොගයක් |
| 26. | අංක රහිත | විවිධ ප්‍රමාණයේ බෝතල් තොගයක් |
| 27. | අංක රහිත | තඹ කැබලි තොගයක් |
| 28. | අංක රහිත | සාම්පල් දැව කැබලි ප්‍රමාණයක් |
| 29. | අංක රහිත | දර තොගයක් |
| 30. | අංක රහිත | ප්ලාස්ටික් වතුර ටැංකි 01 |
| 31. | අංක රහිත | පාපැදි 10 |
| 32. | අංක රහිත | පිහි 15 ක් පමණ |
| 33. | අංක රහිත | කැති 10 ක් පමණ |
| 34. | අංක රහිත | පොරෝ 10 ක් පමණ |
| 35. | අංක රහිත | ඉල්ලංකුරු 10 ක් පමණ |

12-809

---

## දිසා හා මහෙස්ත්‍රාත් අධිකරණය - වලස්මුල්ල

වලස්මුල්ල දිසා හා මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොකියන ලද පහත විස්තර සඳහන් භාණ්ඩ 2011.01.08 වැනි දින පෙ. ව. 10.00 ට වලස්මුල්ල දිසා හා මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. මෙහි පහත සඳහන් හිමිකම් නොපෑ භාණ්ඩ සම්බන්ධයෙන් හිමිකම් කියන අයකු වෙතොත් වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම තම හිමිකම් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත එදින පෙ. ව. 8.30 සිට පෙ. ව. 9.30 දක්වා කාලය තුළ භාණ්ඩ පරීක්ෂා කර බැලීමට ඉඩ දෙනු ලැබේ.

අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍ය වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමට අයිතිය ඇත.

වෙන්දේසියේ මිල දී ගනු ලබන භාණ්ඩ සඳහා එවෙලේ ම මුදල් ගෙවිය යුතු අතර චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩයන් එදිනම ප. ව. 5.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

චන්දිම ලියනගේ,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්.

2010 දෙසැම්බර් මස 02 වැනි දින,
වලස්මුල්ල දිසා හා මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| | | |
|---|---|---|
| 1. | AR/617/02 | අංක 109-7564 දරන හොණ්ඩා යතුරුපැදිය |
| 2. | AR/61/02 | අංක 123 - 7785 දරන යතුරුපැදිය |
| 3. | AR/361/02 | අංක 118 -4267 දරන යමහා යතුරුපැදිය |
| 4. | AR/428/04 | වැසි අංක 1401587 දරන හොණ්ඩා ලි. ප. අංක රහිත යතුරුපැදිය |
| 5. | 9135 | අංක 78-6612 දරන අත්ට්‍රැක්ටරය |
| 6. | 10880 | සීපැන් වර්ගයේ අත්ට්‍රැක්ටරය |
| 7. | 6333 | සීපැන් වර්ගයේ අත්ට්‍රැක්ටරය |
| 8. | 89386 | sp GZ 4458 දරන අත්ට්‍රැක්ටරය |
| 9. | 99405 | සීපැන් වර්ගයේ අත්ට්‍රැක්ටරය |
| 10. | 91955 | අංක 201-4420 දරන ත්‍රිරෝද රථය |
| 11. | 79808 | අංක 135-7092 දරන යතුරුපැදිය |
| 12. | 96968 | sp HH/3899 දරන යතුරුපැදිය |
| 13. | 9122 | Sp JN/3599 ඇග්‍රොටෙක් අත් ට්‍රැක්ටරය |
| 14. | 3687 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 15. | 8481 | රවුම් කියත සහිත ඉරුම් මේසය (යකඩ රාමුව) |
| 16. | 9135 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 17. | 9135 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 18. | 10880 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 19. | 6029 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 20. | 4807 | රවුම් කියත සහිත ඉරුම් මේසය (යකඩ රාමුව) |
| 21. | 6480 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 22. | 96941 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 23. | 97097 | රවුම් කියත සහිත ඉරුම් මේසය (දිරාපත්) |
| 24. | 97458 | රවුම් කියත සහිත ඉරුම් මේසය (දිරාපත්) |
| 25. | 1684 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 26. | 412 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 27. | 96149 | රවුම් කියත පමණි |
| 28. | 92001 | රවුම් කියත සහිත ඉරුම් මේසය (යකඩ රාමුව) |
| 29. | 97004 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 30. | 97518 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 31. | 97552 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 32. | 97645 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 33. | 97899 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 34. | 5682 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 35. | 90753 | රවුම් කියත පමණි |
| 36. | 80378 | කියත් 01 |
| 37. | 55530 | බණ්ඩි කියත් 01 |
| 38. | 68140 | බණ්ඩි කියත් 03 |
| 39. | 63157 | කියත් 01 |
| 40. | 92034 | බණ්ඩි කියත් 01 |
| 41. | 73407 | මහ කියත් 01 |
| 42. | 66973 | බණ්ඩි කියත් 01 |

| | | |
|---|---|---|
| 43. | 67184 | බණ්ඩි කියත් 01 |
| 44. | 66729 | ඉරුම් කියත් 01 |
| 45. | 75341 | අත් කියත් 01 |
| 46. | 65655 | ඉරුම් කියත් 01 |
| 47. | 66839 | බණ්ඩි කියත් 01 |
| 48. | 65479 | බණ්ඩි කියත් 01 |
| 49. | 63873 | බණ්ඩි කියත් 01 |
| 50. | 71231 | බණ්ඩි කියත් 01 |
| 51. | 72368 | බණ්ඩි කියත් 01 |
| 52. | 74858 | බණ්ඩි කියත් 01 |
| 53. | 66836 | බණ්ඩි කියත් 01 |
| 54. | 62851 | කියත් 01 |
| 55. | 65843 | කියත් 01 |
| 56. | 62137 | කියත් 01 |
| 57. | 64409 | කියත් 01 |
| 58. | 66408 | කියත් 01 |
| 59. | 65700 | කියත් 01 |
| 60. | 65654 | කියත් 01 |
| 61. | 63164 | කියත් 01 |
| 62. | 73091 | බණ්ඩි කියත් 01 |
| 63. | 38724 | බණ්ඩි කියත් 01 |
| 64. | 36258 | කියත් 01 |
| 65. | 54501 | කියත් 01 |
| 66. | AR 82/09 | කාන්තා රූලේ පාපැදිය |
| 67. | 10373 | අංක 04052905 දරන වතුර මෝටරය |
| 68. | 6921 | ඇලුමිනියම් කල 01 |
| 69. | 1594 | ඇලුමිනියම් මුට්ටි 01 |
| 70. | 9385 | බුරුත දැව වලින් තනන ලද දිග පුටු 02, තනි පුටු 04යි, ස්ටූල් 02 |
| 71. | 12171 | ස්ටූල් 01, අඩක් නිම කරන ලද පුටු ඇඳි 02යි |
| 72. | - | හිස් බෝතල් තොගයක් |
| 73. | - | යකඩ බැරල් 150ක් |

12-640

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ අංක 7 දරන ඡේදය අනුව මහජනයා වෙත කරන නිවේදනය

සමාගමේ නම : ඇග්‍රෝ ෆෝක්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 74892
ලියාපදිංචි ලිපිනය : කොළඹ පාර, දම්බොක්ක, බෝයගනේ, කුරුණෑගල

සමාගම් ලේකම්වරු.

12-636

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ඇල්ෆ් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 75711
සංස්ථාගත කිරීමේ දිනය : 2010 නොවැම්බර් මස 26
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : කරත්තිප්පොල, කුලියාපිටිය.

අධ්‍යක්ෂ.

12-631

## 2007 අංක 7 දරන සමාගම් ආඥා පනතේ 9 වැනි වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කෙරෙන නිවේදනය

බී ඇන්ඩ් එස් ඔටෝ එන්ටර්ප්‍රයිසස් (පීවීටී) එල්ටීඩී 2010 නොවැම්බර් මස 09 වැනි දින ලියාපදිංචි අංක පීවී 75365 යටතේ සංස්ථාපිතයි.

ලියාපදිංචි ලිපිනය : අංක 160, හයිලෙවල් පාර, හෝමාගම.

මැග්නි කන්සල්ටන්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ්,
ලේකම්.

12-737

## 2007 අංක 7 දරන සමාගම් ආඥා පනතේ 9 වැනි වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කෙරෙන නිවේදනය

කදිර එස්ටේට් මැනේජ්මන්ට් ඒජන්සි (පීවීටී) එල්ටීඩී 2010 නොවැම්බර් මස 09 වැනි දින ලියාපදිංචි අංක පී වී 75366 යටතේ සංස්ථාපිතයි.

ලියාපදිංචි ලිපිනය : අංක 21/1, ලේන් බාන් ස්ට්‍රීට්, කොටුව, ගාල්ල

මැග්නි කන්සල්ටන්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ්,
ලේකම්.

12-738

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී :-

සමාගමේ නම : ඩී ජී ඉන්ටර්නැෂනල් ලොජිස්ටික්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 75608
ලියාපදිංචි දිනය : 2010.11.23
ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය : අංක 8/19, රජ මාවත, කෝට්ටේ.

සමාගම් ලේකම්වරු,
කී මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (පුද්.) සමාගම.

127-717/1

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : විජිත ෆර්නිචර් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 75331
ලියාපදිංචි දිනය : 2010.11.04
ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය : අංක 41, මීරියගල්ල, පාදුක්ක

සමාගම් ලේකම්වරු,
කී මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (පුද්.) සමාගම.

12-717/2

---

## ඇටෝර්නි බලපත්‍රය (විශේෂ) අවලංගු කරලීමයි

කළුතර උතුර, ආබෲ පාර, අංක 235/2 හි පදිංචි ආරි ටර්ලෝ වන මා වර්ෂ 2005 ජනවාරි මස 20 වැනි දින පානදුර ප්‍රසිද්ධ නොතාරිස් වජිර ලක්ෂ්මන් අසුරප්පුලි මහතා විසින් ලියා සහතික කරන ලද අංක 1511 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය තුලින් මා විසින් පත් කරන ලද කළුතර උතුර, ආබෲ පාර, අංක 235/5 දරන ස්ථානයෙහි පදිංචි බලපිටියගේ ඉන්දික යන අය වෙත ලබා දී ඇති විශේෂ ඇටෝර්නි බලය අවලංගු කල බව ශ්‍රී ලංකා ජනරජයට මෙයින් දැනුම් දෙමි.

ආරි ටර්ලෝ,

2010 නොවැම්බර් මස 12 වැනි දින.

12-706

---

## අමාරියා රිසෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

### 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2010 දෙසැම්බර් මස 01 වැනි දින දී සමාගම් ලියාපදිංචි අංක පී. වී. 75786 යටතේ "අමාරියා රිසෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ එහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 05, පාර්ක් රෝඩ්, අංක 30/15 දරන ස්ථානයේ බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

එම් ඇන්ඩ් එන් සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගම් ලේකම්වරු)

එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල,
5 වැනි තලය,
අංක 2, ඩීල් පෙදෙස,
කොළඹ 03.

12-703

---

## දැන්වීමයි

2007 සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ අංක 7 දරන ඡේදය අනුව මහජනයා වෙත කරන නිවේදනයයි

සමාගමේ නම : නැචුරල් රිසෝස් ෆවුන්ඩේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 74969
ලියාපදිංචි ලිපිනය : අංක 141/7, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

සමාගම් ලේකම්වරු.

12 - 705

---

## දැන්වීමයි

2007 සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ අංක 7 දරන ඡේදය අනුව මහජනයා වෙත කරන නිවේදනයයි

සමාගමේ නම : කෙආරින් හැන්ඩ්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 75410
ලියාපදිංචි ලිපිනය : අංක 39/1/1, හෝටන් ප්ලේස්, කොළඹ 07

අධ්‍යක්ෂවරු.

12-704

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : පැන් ඇරබ් ලංකා කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 75172
ලියාපදිංචි කළ දිනය : 2010.10.28

සමාගමේ ලේකම්,
පීර් මොහමඩ් මොහමඩ් අස්ලම්.

12-715

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව ජෙට් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය 2010 නොවැම්බර් මස 25 වැනි දින සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ජෙට් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පීවී 75680
ලියාපදිංචි කළ කාර්යාලය : "ජෙට්වින් හවුස්", 46/26, නවම් මාවත, කොළඹ 02.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

12-806

## ක්වෝලිටි ෆීඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳව මහජනතාවට කෙරෙන දැනුම්දීමයි

2010 දෙසැම්බර් 01 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පීවී 75785 යටතේ ක්වෝලිටි ෆීඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ නව සමාගමේ කාර්යාලීය ලිපිනය ජාඇල, ඒකල, මිනුවන්ගොඩ පාර, අංක 28 හි බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

කන්දයියා නීලකන්ඩන්,
සභාපති.

එම් ඇන්ඩ් එන් ඒජන්ට්ස් ඇන්ඩ් සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ සමාගම් ලේකම්වරු),
එම්. ඇන්ඩ් එන් ගොඩනැගිල්ල,
(5 වැනි තලය),
අංක 2, ඩීල් පෙදෙස,
කොළඹ 03.

12-805

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම 2010 නොවැම්බර් 29 වැනි දින සංස්ථාගත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : කොමියුනිටි රිහැබිලිටේෂන් ඇන්ඩ් ඉකොනොමිකල් ඩිවලොප්මන්ට් සර්විසස් (ගැරන්ටි) ලිමිටඩ්
සමාගමේ අංකය : ජී. එල්. 2116
ලියාපදිංචි කාර්යාලය : 398, අල් - හිලාල් පාර, සයින්දමරුතු - II

මණ්ඩලයේ අණ පරිදි,

සෙකට්‍රීස් ඇන්ඩ් රෙජිස්ට්‍රාර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 32 ඒ, පළමුවන මහල,
ශ්‍රීමත් මොහොමඩ් මාකන් මාකර් මාවත,
කොළඹ 03.

12-678

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳව අප විසින් මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ කලින් නම : කැපිටල් රීච් හෝල්ඩින්ස් ලිමිටඩ්
සමාගමේ අංකය : පීබී 779
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 1, ලේක් ක්‍රෙසන්ට්, කොළඹ 02.
සමාගමේ අලුත් නාමය : සොෆ්ට්ලොජික් කැපිටල් ලිමිටඩ්

සමාගම සඳහා සහ වෙනුවෙන්,

පී. ඩබ්ලිව්. කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරුන්.

12-854

---

## දැන්වීමයි

කැපිටල් ට්‍රස්ට් හෝල්ඩිංග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය 2010 නොවැම්බර් මස 15 වැනි දින සංස්ථාගත කිරීම පිළිබඳව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැනුම් දීමයි.

සමාගමේ නම : කැපිටල් ට්‍රස්ට් හෝල්ඩිංග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 75497
ලියාපදිංචි කළ කාර්යාලය : නො. 42, ශ්‍රීමත් මොහොමඩ් මාකන් මාකර් මාවත, කොළඹ 03.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සෙක්‍රටරීස් ඇන්ඩ් රෙජිස්ට්‍රාස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 32ඒ, පළමු මහල,
ශ්‍රීමත් මොහොමඩ් මාකන් මාකර් මාවත,
කොළඹ 03.

12-847

---

## අවසාන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම (2010.12.07)

ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම යටතේ ඇවරකරුවෙකු පත්කර ඇති බැවින් පිටස්තර පාර්ශවවලට වගකීම් නොමැති බැවින්ද, එම සියළු වාර්තා සමාගම් රෙජිස්ට්‍රාර්වෙත බාරදීම සිදුකර ඇති බැවින්ද, මෙය සමාගමේ අවසන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම ලෙස සැලකීමටත් යෝජනා සම්මතයට එළඹෙන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ලේකම්,
කේ. පී. ලලිත් නන්දික.

සභාපති,
සුමිත් ප්‍රසන්ත රත්නායක.

12-745/1

---

## ඇවරකරු පත්කිරීම

2010 දෙසැම්බර් මස 07 වන දින රැස්වූ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් තීරණයන්ට එළඹෙන ලදී.

2007 අංක 07 දරන සමාගම් පනතේ 309 වැනි වගන්තිය ප්‍රකාරව හා 324 වැනි වගන්තිය යටතේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට ගත් තීරණය අනුව සමාගම් රෙජිස්ට්‍රාර්වරයා දැනුවත් කර ඇති බැවින් එහි ඇවරකරු වශයෙන් ගණකාධිකාරී කේ. වී. කරුණාරත්න මහතා පත් කිරීමට ඒකමතිකව තීරණය කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ලේකම්,
කේ. පී. ලලිත් නන්දික.

සභාපති,
සුමිත් ප්‍රසන්ත රත්නායක.

12-745/2

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## සෙලාන් බැන්ක් පී. එල්. සී. - හැටන් ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ තිස්පනේ කෝරළයේ නාවලපිටිය හපුගස්තලාව ගමේ පිහිටි අලියාවැටිච්චහේන නමැති ඉඩමට බලයලත් මානක එම්. එල්. එම්. ෂෙරීෆ් විසින් 1984.01.16 වැනි දින අංක 2560/84 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් අංක 16 ඒ නමැති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : පර්චස් 130

*ඉඩමට පිවිසීම.*- නාවලපිටිය නගරයේ සිට හපුගස්තලාව කඩවීදිය දක්වා කි. මී. 6.50 පමණ ගමන් ගෙන ගම්පොළ මාර්ගයට පිවිස කි. මී. 1.50 පමණ ගමන් ගත් විට අදාළ දේපළ එම මාර්ගයේ පිහිටා තිබේ.

මෙම දේපළ කොළඹ පාරේ අංක 96 හි හැටන් ඉංජිනියරිං සර්විසස් යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2011 ක් වූ ජනවාරි මස 13 වැනි දින ප. ව. 2.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2000.03.16 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2000.02.11 වැනි දින ඩේලි නිවුස් හා 2000.02.10 වැනි දින දිනමිණ සහ තිනකුරල් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය :-

1. ගැණුම් මිළෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

නිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරී (නීති), සෙලාන් බැන්ක් පී. එල්. සී. සෙලින්කෝ සෙලාන් ටවර් ගොඩනැගිල්ල, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011- 2956285.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝම්ලුව පාර,
වටපුළුව,
මහනුවර.
දුරකථන අංක : 081-2211025, 071-4755974 ෆැක්ස් අංකය 081- 2211025.

12-793

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - කහවත්ත ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පල්ලෙබැද්ද ගමේ පිහිටි රත්නායක පංගුවේ යෝධ වෙල්යායේ හේන නමැති ඉඩමට බලයලත් මානක ඒ. රත්නම් විසින් සාදන ලද 1994.01.16 වැනි දින අංක 3914 දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස හා එහි තුළ පිහිටි නිවාස ගොඩනැගිල්ල ඇතුළු අනෙකුත් සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : පර්චස් 80.

*ඉඩමට පිවිසීම.*- පැල්මඩුල්ල නෝනාගම මාර්ගයේ කි. මී. 31 හා 32 අතර හා පල්ලෙබැද්ද කඩවීදියේ සිට කි. මී. 01 ක් පමණ ගිය විට වම් පසින් හමුවන නිවාස දෙසට දිස්වෙන පාරේ මීටර් 300ක් පමණ ගිය විට අදාළ දේපළ මෙම පාරේ දකුණු පසින් පිහිටා තිබේ.

මෙම දේපළ වීරකෝන් ආරච්චිලාගේ සුනිල් වසන්ත කුමාර වීරකෝන් යන අය බන්ධනදායී වශයෙන් නැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2011 ක් වූ ජනවාරි මස 14 වැනි දින පෙ. ව. 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2010.10.15 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2010.10.19 වැනි දින දිවයින, දි අයිලන්ඩ් හා තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය:-

1. ගැණුම් මිළෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අයකිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011- 2661815, 011- 2661816.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමලුව පාර,
වටපුළුව,
මහනුවර.
දුරකථන අංක : 081-2211025, 071-4755974
ෆැක්ස් අංකය : 081- 2211025.

12-798

---

### හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - බුත්තල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කතරගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සෙල්ලකතරගම ගමේ පිහිටි සෙල්ලකතරගම කැලේ නමැති ඉඩමට බලයලත් මානක කේ. ඩබ්. එස්. කේ. විග්නරාජා විසින් 2008.11.04 වැනි දින සහ අංක එම්. ඕ./1391 දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද ලොට් ඒ දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : හෙක්ටයාර් 0.0608 (පර්චස් 24)

මෙම දේපළ බුත්තල ධනපාල මුදියන්සේලාගේ විමලදාස සහ ධනපාල මුදියන්සේලාගේ ඉන්දික කපිල බණ්ඩාර යන අය ණයකරුවන් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.-* සෙල්ලකතරගම සිට බුත්තල පාරේ. කි. මී. 3.5ක් පමණ මැණික්ගඟ පාලමට ඉදිරිපසින් පිහිටි තණමල්විල පාරට ඇතුළු වී මීටර් 250ක් පමණ ගමන් ගත් විට මෙම පාරේ දකුණු පසින් අදාළ දේපළ පිහිටා තිබේ.

2011 ක් වූ ජනවාරි මස 18 වැනි දින ප. ව. 3.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2010.10.01 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2010.10.05 වැනි දින දිවයින, ද අයිලන්ඩ් හා තිනකුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා ඝෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අයකිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011- 2661815, 011- 2661816.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමලුව පාර,
වටපුළුව,
මහනුවර.
දුරකථන අංක : 081-2211025, 071-4755974
ෆැක්ස් අංකය : 081- 2211025.

12-801

---

### හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - නගර කාර්යාල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඉතා වටිනා පොල් ඉඩමක් හලාවත ලියාපදිංචි කොට්ඨාසය තුළ මීගමුව පුත්තලම මහාමාර්ගයේ කාකපල්ලිය හන්දියට නුදුරුව පිරප්පන්කුලිය සහ මරදන්කුලම ගම්වල පිහිටි කොහොඹ එස්ටේට් නමැති ඉඩමේ බෙදා වෙන් කළ කොටසක් හා එහි තුළ පිහිටි පොල් වගාව, ගොඩනැගිලි ඇතුළු සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : අක්කර 50

මෙම දේපළ ස්ටෑන්ඩර්ඩ් ට්‍රේඩිං කම්පැනි (ප්‍රයිවෙට්) ලිමිටඩ් ණයකරු හැටියට ද, නිරංජලී ලක්ෂ්මි ශ්‍රියානි ප්‍රනාන්දු උකස්කාරිය හැටියට ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.-* කොළඹ සිට මීගමුව පුත්තලම මාර්ගයේ කි. මී. 72ක් පමණ මාදම්පේ පසුකර කාක පල්ලිය දක්වා පැමිණ දකුණට හැරී මැදගම පාරට පිවිස කි. මී. 2.1ක් පමණ මරදන්කුලම හන්දිය දක්වා ගමන් ගන්න. පසුව වම් දෙසට හැරී කොකාවිල් පාරට ඇතුළු වී කි. මී. 1.2ක් පමණ ගිය විට මෙම පාරට මායිම්ව වම් පැත්තේ අදාළ දේපළ පිහිටා තිබේ.

2011 ක් වූ ජනවාරි මස 27 වැනි දින ප. ව. 3.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.07.03 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* ද, 2009.11.03 වැනි දින දිවයින, ද අයිලන්ඩ් හා තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ :

ගැණුම් මිළෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු හා රජය විසින් පනවනු ලබන වෙනත් බදු වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවා නිම කළ යුතු වේ. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අයකිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011- 2661815, 011- 2661816.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමලුව පාර,
වටපුළුව,
මහනුවර.
දුරකථන අංක : 081-2211025, 071-4755974 ෆැක්ස් අංකය : 081- 2211025.

12-802

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - හැටන් ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පදිංචියට සුදුසු දේපළක් හැටන්, අරියගම 19/81 දරන ෆෲට්හිල් හි පිහිටි ෆෲට්හිල් එස්ටේට් නමැති ඉඩමට බලයලත් මානක ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන විසින් සාදන ලද 1987.01.14 වැනි දින අංක 3240 දරන පිඹුරේ සඳහන් බෙදා වෙන් කළ ලොට් 7 දරන ඉඩම් කොටස සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : පර්චස් 10

මෙම දේපළ කරුප්පන් ක්‍රිෂ්ණකුමාර් යන අය බන්ධනදායී වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.*- හැටන් නගරයේ සිට දිඹුල්ල පාරේ. කි. මී. 1.5ක් පමණ අවිස්සාවේල්ල-නුවරඑළිය හන්දිය දක්වා පැමිණ වමට හැරී ෆෲට් හිල් පාරේ මීටර් 200ක් පමණ විත් වමට හැරී ආරියගම නිවාස සංකීර්ණය පාරට පිවිස ඉදිරියට මීටර් 100ක් පමණ ගමන් ගත් විට පාරේ දකුණු දෙසින් අදාළ දේපළ පිහිටා තිබේ.

2011 ක් වූ ජනවාරි මස 13 වැනි දින පෙ. ව. 10.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.09.18 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2009.09.17 වැනි දින දිවයින, ද අයිලන්ඩ් හා තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ.

ගැණුම් මිළෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු හා රජය විසින් පනවනු ලබන වෙනත් බදු, වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවා නිම කළ යුතු වේ. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අයකිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක 011- 2661815, 011- 2661816.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමලුව පාර,
වටපුළුව,
මහනුවර.
දුරකථන අංක : 081-2211025, 071-4755974
ෆැක්ස් අංකය: 081- 2211025.

12-800

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - බොරලැස්ගමුව ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සිද්දමුල්ල ගමේ තනයන්ගොඩැල්ල නමැති ඉඩමට බලයලත් මානක එන්. පී. ඇල්විටිගල විසින් සාදන ලද 2006.10.10 වැනි දින අංක 2769 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 1 නමැති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : පර්චස් 13.

මෙම දේපළ පූර්ණිමා ශෂි ප්‍රභා හල්පවත්තගේ සහ ගම්මන විදානෙලාගේ චමින්ද විශ්වජිත් පෙරේරා යන අය ණයකරුවන් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*ඉඩමට පිවිසීම.*- පිළියන්දල නගර මධ්‍යයේ සිට කොට්ටාව මහා මාර්ගයේ කිලෝ මීටර් 4ක් පමණ සිද්දමුල්ල දක්වා ගමන් ගත් විට 8 වැනි පටුමගට යාබදව (සමුපකාර ගොඩනැගිල්ල ඉදිරිපසින්) පාරේ වම් පස අදාළ දේපළ පිහිටා තිබේ.

2011 ක් වූ ජනවාරි මස 17 වැනි දින පෙ. ව. 10.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2008.09.12 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2008.12.11 වැනි දින ද අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් යන පුවත්පත් බලන්න. එමෙන් ම විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2008.09.12 වැනි දින ගැසට් පත්‍රය බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ.

ගැණුම් මිළෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවා නිම කළ යුතු වේ. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අයකිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක 011- 2661821, 011- 2661815.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමලුව පාර,
වටපුළුව,
මහනුවර.
දුරකථන අංක : 081-2211025, 071-4755974
ෆැක්ස් අංකය : 081- 2211025.

12-799

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරුණු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 8/72455/ඉසෙඩ් 8/585.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2010.05.21 *ගැසට් පත්‍රයේ* සහ 2010.11.01 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය මාතර, කොටුව ශ්‍රී ධර්මාරාම මාවත, අංක 14 හි බලයලත් වෙන්දේසිකාර එන්. එච්. පී. එෆ්. ආරියරත්න මයා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2011.01.18 වැනි දින පෙරවරු 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

ගාල්ල දිස්ත්‍රික්කයේ තල්පේ පත්තුවේ අක්මීමන ප්‍රාදේශීය සභා සීමාව තුළ කලහේ පිහිටි සුරවීරගේ අළුත්වත්ත අද්දර ඕවිට නැමැති ඉඩමට 2001.09.21 දින බලයලත් මිනින්දෝරු එස්. පීරිස් විසින් මැන සකසන ලද අංක 888 දරන පිඹුරේ කැබලි අංක 20 ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අක්. 0 රූඩ්. 0 පර්. 9.50 ක් වූ බිම් කොටස.

මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 719/184 යටතේ ලියාපදිංචි වී ඇත.

ඩබ්. එම්. දයාසිංහ,
සාමාන්‍යාධිකාරී.

2010 දෙසැම්බර් මස 09 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

12-850

---

## සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එස්. එම්. විජේතුංග සහ ඩබ්ලිව්. ඊ. එල්. වයි. චාන්දනී නොහොත් ඩබ්ලිව්. වයි. සී. ඊ. ලියනගේ
ගිණුම් අංක : 0026 5001 6613.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2010.03.25 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දහසය ලක්ෂ දහ අට දහස් හත්සිය විසි තුනයි ශත දහයක (රු. 16,18,723.10) මුදල ද, 2010 පෙබරවාරි මස 09 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දහ හතර ලක්ෂ හැට අට දහස් හයසිය හැත්තෑ නමයයි ශත අනූ එකක (රු. 14,68,679.91) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොලිය ද හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.10.15 දින *රජයේ ගැසට් පත්‍රයේ* 2010.10.05 දින "දිවයින", "තිනකුරල් " සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2011.01.17 වැනි දින ප. ව. 3.30 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ උතුරු කළුතර තොටමුණේ කළුතර දෙබැද්දේ කළුතර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පාලතොට පිහිටි "මිල්ලගහවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන

එච්. පී. ඒ. ජයවික්‍රම යන අය විසින් සාදන ලද 2007 ඔක්තෝබර් මස 13 දාතම හා අංක 11151 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 3 ඒ වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 425 දරන පිඹුරේ ලොට් 31 (අඩි 10 පළල පාර) නැගෙනහිරට : අංක 425 දරන පිඹුරේ ලොට් 30 (පාර), දකුණට : අංක 425 දරන පිඹුරේ ලොට් 30 සහ බස්නාහිරට : එස්. සමරනායක යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම අංක 425 දරන පිඹුරේ ලොට් 02 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම හතරක් (අක්. 0 රූ. 0 පර්. 16.4) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 11151 දරන පිඹුරට අනුව වෙලුම/පත්ඉරුව ජී 245/226 යටතේ කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් 3 ඒ පහත සඳහන් නැවත මිනුමකි. -

එකී කළුතර දෙබැද්දේ පාලතොට පිහිටි "මිල්ලගහවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන සිරි බෝපේ ආරච්චි යන අය විසින් සාදන ලද 1988 අගෝස්තු මස 21 දාතම හා අංක 425 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 3 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 31 නැගෙනහිරට : ලොට් 30, දකුණට : ලොට් 30 සහ බස්නාහිරට : ලොට් 02 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම හතරක් (අක්. 0 රූ. 0 පර්. 16.4) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද වෙනත් අයිතීන් ද වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 425 දරන පිඹුරට අනුවය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

12-852/9

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එස්. විජයසේකර විවාහයට පෙර සහබන්දු සහ එම්. පී. ජයසිංහ
ගිණුම් අංක : 0001 5014 8170.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2010.04.27 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හත් ලක්ෂ හැත්තෑ දහස් හයසිය තිස් හයයි ශත විසි හතරක (රු. 7,70,636.24) මුදල ද, 2010 පෙබරවාරි මස 11 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හත් ලක්ෂයක (රු. 7,00,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොලිය ද හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.07.09 දින රජයේ *ගැසට් පත්‍රයේ* 2010.06.22 දින "දිවයින", "තිනකුරල් " සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2011.01.17 දින පෙ. ව. 11.30 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා සීමාවන් තුළ අත්තිඩියේ පිහිටි ප්‍රධාන පාර, වරිපනම් අංක 216/1 දරන "කෝන්ගොමුවේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. ඒ. එම්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1996 නොවැම්බර් මස 26 දාතම හා අංක 933 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 2 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 3 සහ මිනුම් පිඹුරු අංක 928 හි ලොට් 4 වශයෙන් ලකුණු කොට ඇති පාර සඳහා වෙන් කිරීම, නැගෙනහිරට : මිනුම් පිඹුරු අංක 928 හි ලොට් 8, දකුණට කොව්ලෝන් ගාමන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් හි ඉඩම සහ බස්නාහිරට : මෙහි ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම බිංදුවයි හයක් (අක්. 0 රූඩ් 0 පර්. 6.06) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 933 දරන පිඹුරට අනුව වෙලුම/පත්ඉරුව එම් 2032/218 යටතේ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

අංක 928 හා 1994 ජූලි 17 දාතම දරන පිඹුරේ ලොට් 4.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

12-851/3

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

පී. ඩී. පියසේන
ගිණුම් අංක : 1057 5006 8347.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2009.10.29 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය

විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් තුන් ලක්ෂ හතලිස් හත් දහස් නමසිය හැට එකයි ශත හැත්තෑ හතරක (රු. 3,47,961.74) මුදල ද, 2009 ජූලි 14 දින සිට අංක 891 සහ 1546 දරන බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දෙලක්ෂ විසි තුන් දහස් හත්සිය හැත්තෑ හතයි ශත එකක (රු. 2,23,777.01) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළවක් (15%) හා තවත් රුපියල් පනස් හය දහස් එකසියයක (රු. 56,100) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි එකක් (21%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.12.11 දින රජයේ *ගැසට් පත්‍රයේ* 2009.11.26 දින දිවයින, තිනකුරල් සහ අයිලන්ඩ් දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2011.01.18 දින පෙ. ව. 11.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළේ කුඹුකේ පත්තුවේ හොරණ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ (කළුබෝවිල උප කාර්යාලය) තලගල ග්‍රාමයේ පිහිටි "තලගල එස්ටේට්" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. කපුගීකියන යන අය විසින් සාදන ලද 1990 මාර්තු 08 දාතම හා අංක 3113 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්නය කොට ලොට් 2 එෆ් වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එම පිඹුරේ ලොට් 2 ඊ, නැගෙනහිරට : එහි ලොට් 2 (අංක 272 දරන පිඹුරේ ලොට් 2 ජේ සහ 7 සී ඔප්පුව පරිදි), දකුණට : එම පිඹුරේ ලොට් 2 ජී සහ බස්නාහිරට : අංක 272 දරන පිඹුරේ ලොට් 7 ඒ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළවයි දශම පහයි බිංදුවක් (අක්. 0 රූ. 0 පර්. 15.50) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 3113 දරන පිඹුරට අනුව වෙලුම/පත්ඉරුව සී 246/145 යටතේ හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ දිගේ, ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය :

හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම/පත්ඉරුව සී 105/266 යටතේ ලියාපදිංචි කොට ඇති සහ අංක 3113 දරන එකී පිඹුරේ ලොට් 2 ජේ (අඩි 20 පළල පාර) හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව සී 105/217 යටතේ ලියාපදිංචි කොට ඇති සහ බලයලත් මානක තැන පී. කේ. සුමනදාස යන අය විසින් සාදන ලද 1988 දෙසැම්බර් මස 14 දාතම හා අංක 76/2002 දරන පිඹුරේ ලොට් ආර් (අඩි 20 පළල පාර).

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

12-851/2

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

බී. එම්. අයි. ජේ. පියසේන
ගිණුම් අංක : 1057 5001 9664.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2009.01.29 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හත් ලක්ෂ අසූ හය දහස් නමසිය පනහයි ශත හතලිස් හයක (රු. 7,86,950.46) මුදල ද, 2008 නොවැම්බර් මස 28 දින සිට අංක 1449 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හත් ලක්ෂ පනස් එක් දහස් අටසිය හැට තුනයි ශත හැත්තෑ එකක (රු. 7,51, 863.71) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනයි දශම පහක් (13.5%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.09.25 දින රජයේ *ගැසට් පත්‍රයේ*, 2009.09.17 දින දිවයින, තිනකුරල් සහ අයිලන්ඩ් දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2011.01.17 දින පෙ. ව. 10.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළයේ පල්ලේ පත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ දකුණු පිටිපන පිහිටි "රෝසගහවත්ත නොහොත් කොස්ගහවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. කේ. සුමනදාස යන අය විසින් සාදන ලද (1999 ජූලි මස 27 ඔප්පුව පරිදි) 1997 ජූලි 27 දාතම හා අක 76/4333 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 4/3 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට ලොට් 4/2, නැගෙනහිරට : ලොට් 4/4 (පාර), දකුණට : පවුම්ගොඩැල්ල පාර සහ බස්නාහිරට : ලොට් 4/1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ තුනයි දශම අටක් (අක්. 0 රූ. 0 පර්. 13.8) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ, සියලුම මාර්ග අයිතීන් ද වෙනත් අයිතීන් ද වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 76/4333 දරන පිඹුරට අනුව වෙලුම/පත්ඉරුව ජී 1225/296 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

12-851/1

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී - කුරුණෑගල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

රිදීගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ රිදීගම ගමේ පිහිටි හේන්යාගොඩ පිල්ලෑව දැන් වත්ත නමැති ඉඩමට බලයලත් මානක එල්. ඩී. මොල්ලිගොඩ විසින් සාදන ලද 2003.09.18 වැනි දින අංක 4059 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 1 නමැති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගහකොළ වගාව ඇතුළු අනෙකුත් සියළු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 109.1

*දේපලට පිවිසීම*.- රිදීගම නගරයේ සිට කැප්පෙටිගල පාරේ කි. මී. 1.6 ක් පමණ රිදීගම දේවාලය දක්වා ගමන් ගෙන වමට හැරී බෙලවෙහෙර පාරට ඇතුළුවී මී. 400 ක් පමණ පොදු ළිඳ හන්දිය දක්වා පැමිණ දකුණට හැරී කොන්ක්‍රිට් කරන ලද පාරට හැරෙන්න. මෙම පාරේ මී. 150ක් පමණ ගමන් කර දකුණට හැරී අදාළ දේපලට දිස්වෙන පාරට ඇතුළු වී පාර අවසානය දක්වා ගිය විට අදාළ දේපල පිහිටා තිබේ.

මෙම දේපල, රත්නායක මුදියන්සේලාගේ ගාමිණී බණ්ඩාර රත්නායක යන අය බන්ධනදායි වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2011 ක් වූ ජනවාරි මස 28 වැනි දින ප.ව. 1.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.12.11 වැනි දින රජයේ ගැසට් පත්‍රයද 2009.12.09 වැනි දින ද අයිලන්ඩ්, ලක්බිම සහ තිනකුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : කළමණාකාරතැන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී අංක 4, සුරතිස්ස මාවත, කුරුණෑගල.

දුරකථන අංක : 037-2224092/037-2224556 /037-5624003.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමළුව පාර, වටපුළුව, මහනුවර.
දුරකථන අංක : 081-2211025/071-4755974 ෆැක්ස් : 081-2211025

12-795

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ වටිනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 15073 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත් පත්තුවේ උඩපොළ ඕතොට කෝරළේ, ගල්බඩගම පිහිටි, මහහේන නව් වත්ත ලෙස හැඳින්වෙන, බලයලත් මිනින්දෝරු ඒ. ඒ. පද්මදාස විසින් සාදන ලද 1996 පෙබරවාරි මස 02 වන දිනැති අංක 646 දරන පිඹුරේ ලොට් අංක 01 සහ ලොට් අංක 03 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : ලොට් අංක 01- අක් 0, රූ 0, පර්. 15.3, ලොට් අංක 03-1 අක්. 01 රූඩ් 03, පර්. 4.7 එහි පිහිටි සියල්ල සහිතව.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත් පත්තුවේ, උඩපොළ ඕතොට කෝරළේ, ගල්බඩගම ලින්දර පිහිටි, හිටිනවත්ත ලෙස හැඳින්වෙන, බලයලත් මිනින්දෝරු ඒ. ඒ. පද්මදාස විසින් සාදන ලද 1996 පෙබරවාරි මස 02 වන දිනැති අංක 646 දරන පිඹුරේ ලොට් අංක 02 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය. ඉඩමේ ප්‍රමාණය : ලොට් අංක 02 - අක් 01, රූඩ් 03, පර්. 1.7 එහි පිහිටි සියල්ල සහිතව. කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩබ්. හපුවත්ත විසින් සහතික කරන ලද 2001 ජූනි මස 29 වැනි දිනැති අංක 15073 දරන උකස්කරය ප්‍රකාර, පොල්ගහවෙල පදිංචි, ආරියකුලසිංහගේ ලක්ෂ්මන් ආරියකුලසිංහ විසින් ඩීඑෆ්සීසී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම් වලදී පොරොන්දු නිසායාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ ඩීඑෆ්සීසී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2011 ජනවාරි මස 10 වැනි දින (සඳුදා) පෙ.ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය*.- මිළ තීන්දු වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය .

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. ගැණුම් මිලෙන් 12% ක් වැට් බදු (සියයට දොළහක්),
3. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
5. රු. 34,000 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
6. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
7. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු හෝ අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩීඑෆ්සීසී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න : දුරකථන අංක 011-2442442.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමැතිය ලත්, සියවසකට අධික කලක්
ශ්‍රී ලංකාවේ පිළිගත්, පුරෝගාමී වරලත්
වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර,
දුරකථන අංක : 081-2227593,
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05,
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176
ඊමේල් :schokman@samera 1892.com.

වෙබ් අඩවිය :www.schokmanandsamerawickereme.com

12-766

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී -ඇල්පිටිය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී (ලියාපදිංචි අංක පීකිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වලල්ලාවිටි කෝරළේ, බෙන්තොට ඇල්ල තනබද්දේගම ගමේ පිහිටි තානායම්කන්ද හෙවත් ඉගල්කැලේ නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ආරියසේන විසින් මැන සාදන ලද අංක 2905 සහ 2007 ජුනි මස 26 වැනි දින දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 957 න් බෙදා වෙන් කළ කොටසක් හෙවත් ඇල්ල පාරේ වරිපනම් අංක 3/4 වන ලොට් 957E නැමැති බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්.

ප්‍රමාණය : පර්චස් දහයක්,
(අ. 0, රූ. 0, පර්. 10) හෙවත් වර්ග මීටර 252.93 විශාල ඉඩම සහ ඒ මත පිහිටි පස, ගහකොළ, ගොඩනැගිලි සහ සියලු දේත් සමඟ වේ.

පත්තිනියා හකුරු සුමිත් ජීවානන්ද ණයකරු හැටියට ද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ,

2011 ජනවාරි මස 18 වැනි දින ප. ව. 2.00 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2010.07.30 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද 2010.08.03 වැනි දින ලක්බිම, වීරකේසරී සහ ද අයිලන්ඩ් පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2010.12.24 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* සහ 2010.12.27 වැනි දින ලක්බිම සහ අයිලන්ඩ් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.*- දකුණු අධිවේගී මහා මාර්ගයේ සිට මීටර් 50 ක් දුරින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය :

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
4. නොතාරිස් ගාස්තුව රු. 2,000,
5. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
7. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ ඇල්පිටිය ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී,
අංක 51/ඒ,
අම්බලන්ගොඩ පාර,
ඇල්පිටිය.
දුරකථන අංක : 091-2290284-5
ෆැක්ස් අංකය : 091-2290286.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, උසාවි කොමසාරිස්,
තක්සේරුකරු, බලයලත් ජොෂ්ඨ වෙන්දේසිකරු,
අංක 99, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංකය : 011-2445393.

12-788

---

**වටිනා ඉඩම් කැබලි 19 ක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

ගල්කිස්ස දිසා අධිකරණ නඩු අංක 28/96 එම්බී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති අධිකාරි පත්‍රය අනුව මහර/වැලිවේරිය නගර සභා සීමාවේ රම්‍ය පාර (රම්‍ය පෙදෙස) මොරහේනවත්ත (සාරභූමි නිවාස) නමැති ඉඩමේ පිඹුරු අංක 3316 ප්‍රකාරව බෙදා වෙන් කරන ලද වටිනා බිම් කොටස් 19 ක් වර්ෂ 2011 ක් වූ ජනවාරි මස 22 වැනි දින පෙ.ව. 10 ට ආරම්භ වන පරිදි එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ඉඩමට පිවිසීම.*- වැලිවේරිය සිට කිරිඳිවෙල දක්වා ප්‍රධාන පාරේ වැලිවේරිය නගරයට ආසන්නව මොරහේනවත්ත පාරේ දකුණු පසට වන්නට පිහිටි රම්‍ය පෙදෙසෙහි සාරභූමි නිවාස පිහිටා ඇත.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළයේ බටහිර මැද පත්තුවේ ඇටිකෙහෙල්ගල්ල නම් ගමෙහි පිහිටි මොරහේනවත්ත නම් වූ ඉඩමට වර්ෂ 1985.09.28 දින වරලත් මිනින්දෝරු කේ. පී. හර්බට් පෙරේරා මහතා විසින් මැන සාදන ලද අංක 3316 පිඹුර ප්‍රකාර කැබලි අංක 2 (පර්චස් 10), අංක 05 (පර්චස් 15), අංක 10 (පර්චස් 15), අංක 12 (පර්චස් 20), අංක 15 (පර්චස් 20), අංක 16 (පර්චස් 20), අංක 17 (පර්චස් 20), අංක 18 (පර්චස් 20), අංක 19 (පර්චස් 20), අංක 20 (පර්චස් 20) අංක 21 (පර්චස් 20), අංක 22 (පර්චස් 28), අංක 23 (පර්චස් 23.75) අංක 24 (පර්චස් 20), අංක 25 (පර්චස් 20), අංක 29 (පර්චස් 20), අංක 30 (පර්චස් 20), අංක 31 (පර්චස් 15) සහ අංක 32 (පර්චස් 15).

වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරුවන් විසින් පහත සඳහන් කොන්දේසි සම්පූර්ණ කළ යුතුයි :

*කොන්දේසි :-*

1. ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25%,
2. නොතාරිස් ගාස්තු සහ ගමන් ගාස්තු රු. 2,000,
3. වෙන්දේසි කොන්දේසි සහ වෙන්දේසි නොතීසි පිළියෙල කිරීම රු. 2,000,
4. වෙන්දේසිකරුගේ ගාස්තු 2.5%,
5. රජයේ ගාස්තු (පළාත් සභා බදු) 1.0%,
6. ලිපිකරු සහ සෝෂක ගාස්තු රු. 500.00 ගෙවිය යුතුය.
7. ගැණුම් මිලෙන් ඉතිරි 75% ක මුදල දින 30ක් ඇතුළත දී ගල්කිස්ස දිසා අධිකරණයේ තැන්පත් කළ යුතුය. එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති 25% ක මුදල ආපසු නොගෙවීමට ද එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට අයිතිය ඇත.

හිමිකම් පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා විමසන්න :

* රෙජිස්ට්‍රාර්, දිසා අධිකරණය, ගල්කිස්ස
* ඒ. ඒ. ආර්. ප්‍රේමලතා මිය. උසාවි කොමසාරිස්, තක්සේරුකරු සහ වෙන්දේසිකරු, දිසා අධිකරණය, ගල්කිස්ස, අංක 115/1, පීඑස් පෙරේරා මාවත, මාම්පෙ, පිලියන්දල<br>දුරකථන : 4917701, 2617660, 077-9662738

* ඇවරකරු<br>සීමාසහිත යුනියන් ට්‍රස්ට් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස්, (කොළඹ දිසා අධිකරණ නඩු අංක 23/සීඕ යටතේ දැනට ඇවරවෙමින් පවතින)<br>අංක 30 2/1, ගාලු පාර, කොළඹ 06.<br>දුරකථන අංකය : 2508874.

12-791

---

**සෙලාන් බැංකුව පී. එල්. සී - ගල්කිස්ස ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ විකිණීම

මෙම දේපළ කොළඹ 03 ලියාපදිංචි අංක එන් (පීවීඑස්) 1234 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන එලිමෙක් ඉන්ජිනියර්ස් ප්‍රයිවට් ලිමිටඩ්, දෙදෙනාම ගල්කිස්ස පදිංචි පට්ටිවිලගේ ඩඩ්ලි ප්‍රනාන්දු සහ පට්ටිවිලගේ ජෝසප් ශ්‍රීලාල් ප්‍රනාන්දු සහ ගල්කිස්ස පදිංචි විදානලාගේ නිලන්තනී දේවිකාරානි ඉනෝකා ප්‍රනාන්දු (විවාහයට පෙර) ද මෙල් යන අය බන්ධනදායීන් වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*1 වැනි වෙන්දේසියේ විකිණීම.-*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ රත්මලාන උතුර පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. දන්තනාරායන විසින් සාදන ලද 1990.10.13 දිනැති අංක 1568 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන රත්මලාන එස්ටේට් හෙවත්, මවුන්ට් අත්තිඩිය හෙවත් ටෙම්ප්ලර්ස් එස්ටේට් දැන් මල්ලිකා මාවත වරිපනම් අංක 14 ඒ (කොටසක්), දරන ඉඩමේ ලොට් එෆ් 5 ඒ ඒ ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස, එකී අංක 1568 දරන සැලැස්ම අනුව පර්චස් නවයයි දශම අටයි එකක් (අ. 0, රූ. 0, පර්. 9.81) විශාල ඉඩම. මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1748/123 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපළ 2011 ජනවාරි මස 10 වැනි දින, පෙරවරු 10.45 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.-* ගල්කිස්ස මංසන්ධියේ සිට ගාලු පාර ඔස්සේ රත්මලාන දෙසට මීටර් කිහිපයක් ගිය විට වම්පසට ඇති ටෙම්ප්ල්ස් පාරට හැරෙන්න. එම මාර්ගයේ තවත් කි. මී. 12 ක් පමණ ගියවිට පිහිටි සිද්ධාලේප රෝහල ද පසු කළ විට පිහිටි තැපැල් කණුව ඉදිරිපිටින් වම්පසට පිහිටි සොයිසා පාරට හැරී තවත් මීටර් 75-100 ක් පමණ ගොස් නැවතත් දකුණු පසට ඇති මල්ලිකා මාවතට හැරී තවත් මීටර් 100 ක් පමණ ඉදිරියට ගිය විට පාරේ දකුණු පස වරිපනම් අංක 14ඒ දරන අදාළ දේපළ පිහිටා ඇත.

*2 වැනි වෙන්දේසියේ විකිණීම :-*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ දෙහිවල ගල්කිස් මහ නගර සභා සීමාව තුළ රත්මලාන උතුර පිහිටි බලයලත් මිනින්දෝරු බී. එච්. ඒ ද සිල්වා විසින් සාදන ලද 1990.08.26 දිනැති අංක 1068 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන රත්මලාන එස්ටේට් නමැති එහි පිහිටි සියලු දේ සමග දැන් ගෝතමී මාවත වරිපනම් අංක 18 කොටසක් දරන ඉඩමේ ලොට් 39ඒ ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 1068 දරන සැලැස්ම අනුව පර්චස් නවයයි දශම එකයි තුනක් (අ. 0, රූ. 0, පර්. 9.13) විශාල ඉඩම. මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 1805/149 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපළ 2011 ජනවාරි මස 10 වැනි දින පෙරවරු 11.15 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.-*ගල්කිස්ස මංසන්ධියේ සිට ගාලු පාර ඔස්සේ රත්මලාන දෙසට මීටර් කිහිපයක් ගිය විට වම්පසට ඇති ටෙම්පල්ස් පාරට හැරෙන්න. එම මාර්ගය ඔස්සේ තවත් කි. මී. 1.6 ක් පමණ ගිය විට පිහිටි හතරමං හන්දියෙන් වම්සට ඇති 1 වැනි හරස් පාරට හැරී එම මාර්ගය ඔස්සේ තවත් මීටර් 100-150 ක් පමණ ගිය විට ගෝතමී මාවත සහ 1 වැනි හරස් පාර හමුවන හන්දියේ පාරේ වම් පස අදාළ දේපළ පිහිටා ඇත.

*3 වැනි වෙන්දේසියේ විකිණීම :-*

බස්නාහිර පළාතේ, (මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) ගම්පහ දිස්ත්‍රික්කයේ වත්තල ප්‍රාදේශීය සභාවේ පමුණුගම උප කාර්යාල සීමාව තුළ දෙල්තර ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් සාදන ලද 2000.01.28 දිනැති අංක 6301 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ගොඩනැගිලි, ගස් වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 6301 දරන සැලැස්ම අනුව අක්කර පහයි, පර්චස් හතරයි දශම හතරක් (අ. 5, රූ. 0, පර්. 4.4) විශාල ඉඩම. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් බී 193/99 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපල 2011 ජනවාරි මස 10 වැනි දින පස්වරු 2.00 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.*- ජාඇල සිට මීගමුව පාර ඔස්සේ තුඩැල්ල දක්වා ගිය විට වම්පසට ඇති බෝපිටිය - පමුණුගම පාරට හැරෙන්න. එම මාර්ගය ඔස්සේ තවත් කි. මී. 1.2 ක් පමණ ගිය විට පාරේ දකුණු පස අදාළ දේපළට පිවිසෙන මාර්ගය පිහිටා ඇත. එම මාර්ගයේ තවත් මීටර් 300- 350 ක් පමණ ගිය විට මාර්ගය අවසානයේ අදාළ දේපළ පිහිටා ඇත.

*4 වැනි වෙන්දේසියේ විකිණීම.*-

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහ නගර සභා සීමාව තුළ කොල්ලුපිටිය පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ආර්. ඩයස් අබේගුණවර්ධන විසින් සාදන ලද 1991.12.30 දිනැති අංක 3932 දරන සැලැස්ම අනුව වාලුකාරාම පාර වරිපනම් අංක 156, 158, 160 සහ 162 දරන අඹගහවත්ත නමැති ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් දහහතරයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 14.5) විශාල ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් ඒ 903/276 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපළ 2011 ජනවාරි මස 10 වැනි දින පෙරවරු 10.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.*- ලිබර්ටි සිනමා ඉදිරිපිට පිහිටි වටරවුමේ සිට ආර්. ඒ. ඩී. මැල් මාවත ඔස්සේ (ඩුප්ලිකේෂන් පාර) බම්බලපිටිය දෙසට කි. මී. 1.2 ක් පමණ ගිය විට (මහානාම විද්‍යාලය පසුකළ විට) වම්පසට ඇති වාලුකාරාම පාර හමුවේ. එම මාර්ගයේ කෙළවර පිහිටි වාලුකාරාම පන්සල් දොරටුව දක්වා ගිය විට මාර්ගයේ දකුණු පස පන්සලට යාබදව " බේලොත්ඩිනා කෝට්" නමැති අදාළ දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.*- රජයේ ගැසට් පත්‍රයේ 2010.11.19 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2010.11.13 වැනි දින ද, තිනකුරල් පුවත්පතේ 2010.11.25 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය:- 1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්), වන පළාත් අධිකාරී බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිම කළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : සහකාර සාමාන්‍යාධිකාරී (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක : 011-2456285, 2456283, 2456275.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක : 011-3068185, 011-2572940.

12-817

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - වත්තල ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

(කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හල්ලොළුව විසින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද අංක 1577 සහ 2006.02.27 දින දරන ණය බැඳුම්කරය මත සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන මහතා විසින් සහතික කරන ලද අංක 3044 සහ 2009.11.29 වැනි දින දරන ණය බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, ඌරල ලියනගේ දොන් ජයන්ත ගුණසිංහ සහ හෙට්ටිආරච්චිගේ ශාන්ති ගුණසේකර (විවාහයට පෙර ගුණසිංහ) යන අයවලුන් ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ වර්ෂ 2011 ක් වූ ජනවාරි මස 19 වැනි දින ප.ව. 2.30 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, බටහිර සියණෑ කෝරළයේ අධිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා බල සීමාව තුළ, එඬේරමුල්ල ගමෙහි ගොංගිතොට පිහිටි දෙල්ගහවත්ත, කැටකැලගහවත්ත, මිල්ලගහවත්ත, දවටගහවත්ත, ගොරකගහවත්ත සහ පරණකන්ද නමැති ලොට් අංක 242 ඒ දරන ඉඩම් කොටසට බලයලත් මිනින්දෝරු ඩී. සී. එම්. එස්. විමලරත්න මහතා විසින් 2006.01.10 වැනි දින මැන සාදන ලද අංක 13/2006 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති
විශාලත්වය : අ. 0, රූ. 0, පර්. 11.10

වැඩිදුර විස්තර සඳහා.-2009.03.09 වන දින රජයේ ගැසට් පත්‍ර හා 2009.09.10 වැනි දින ද අයිලන්ඩ්, දිවයින හා තිනකරන් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම.*- වත්තල, එඬේරමුල්ල හරහා දිවුලපිටිය මාර්ගයේ එඬේරමුල්ල හංදියට පැමිණි පසු හමුවන ගොංගිතොට පාරේ ජාතික නිවාස සංකීර්ණයේ වරිපනම් අංක. 242ඒ දරන ස්ථානයේ මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*-වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් සිදුකළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ :

1. වෙන්දේසිය තීන්දු වූ විගස ගැණුම් මිළෙන් 10% ක මුදලක්ද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක බදු මුදල ද,
3. ගැණුම් මිලෙන් 2 1/2% ක් වූ වෙන්දේසිකරුගේ කොමිස් මුදල ද,
4. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000,
5. ලිපිකර හා සෝෂකගේ ගාස්තුව රු. 1,000,
6. ප්‍රචාරක වියදම් ද.

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට ද එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට ද බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු අදාළ ලේඛන පරීක්ෂාකර බැලීමට හා වැඩි විස්තර දැන ගැනීම සඳහා ජ්‍යෝෂ්ඨ කළමනාකාර (ණය අයකිරීම්), හැටන් නැෂනල් බැංකුව පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2664664.

ශ්‍රියාණි මනම්පේරි,
ප්‍රසිද්ධ වෙන්දේසිකරු, උසාවියේ කොමසාරිස්,
තක්සේරුකරු සහ බ්‍රෝකර්.

දුරකථන අංක : 011-2320074 හෝ 0713-151356.
අංක 09, බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.

12-836

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කළුතර ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කළුතර ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඒ. පුංචිහේවා විසින් සහතික කරන ලද්දා වූද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දා වූ ද, 2005.10.13 දින අංක 7742 සහ පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී.වී. එන්. ඩබ්. පෙරේරා විසින් 2007.02.13 දින අංක 1861 සහ 2008.02.28 දින අංක 2299 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, පිල්ලලියන ආරච්චිගේ සුනිල් රත්නසිරි ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ, එම දේපළ පිහිටි ස්ථානයේ දී 2011 ක් වූ ජනවාරි මස 10 වැනි දින පෙ.ව. 11.30 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි වස්කඩුව උප කාර්යාලය තුළ මැලෑගම ගමෙහි පිහිටි වැකඩුල්ලේ වත්තේ කට්ටියෙන් බෙදා වෙන් කළ ලොට් ඒ 01 බී 2 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස පර්චස් දහයක් (පර්. 10) විශාල ඉඩම තුළ ඇති ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේ සමග.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2010.10.01 දින රජයේ *ගැසට් පත්‍රය* සහ 2010.11.01 දින ද අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම*.- පානදුර සිට ගාලු පාරේ ඉදිරියට යන විට වාද්දුව හන්දිය හමුවේ. එතැනින් වමට හැරී මොරොන්තුඩුව පාරේ මීටර් 800 ක් පමණ ගිය පසු දකුණට හැරුනු තැන මහාවිහාර පාර හමුවේ. එතැනින් මීටර් 300 ක් පමණ ගොස් වමට හැරුනු පසු (විරුද්ධ පැත්තේ පංසලක් ඇත) රතනසාර මාවත හමුවේ. (ප්‍රාදේශීය සභාවට අයත් බොරලු පාරකි). එම මාවත ඔස්සේ මීටර් 400 ගිය පසු (150 ක් පමණ පසු කළ විට) වොලිබෝල් ක්‍රීඩාංගනය හමුවේ. එම ක්‍රීඩාංගනය වම්පස අදාළ ඉඩම හමුවේ.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වූ වහාම උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය :

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකයි (1%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහයි (2.5%),
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000,
5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500,
6. වෙන්දේසිය සඳහන් වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්.

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුල දී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතුය. දින 30 ක් තුළ ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල ආපසු නොගෙවන අතර, දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ අදාළ ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා .-

ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අයකිරීම්),
හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී,
අංක 479, ටී. බී. ජයා මාවත,
කොළඹ 10.
දුරකථන අංක : 011-2661835, 011-2661826.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේකරුකරු සහ උසාවි කොමසාරිස්,
අංක 99, උසාවිය පාර, කොළඹ 12.
දුරකථන අංකය : 011-3144520
දුරකථනය/ෆැක්ස් :011-2445393.

12-815

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මීගමුව ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පදිංචියට සුදුසු වටිනා දේපළක්.- බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, (මීගමුව ලියා පදිංචි කිරීමේ කොට්ඨාසයට අයත්), අළුත්කුරු කෝරළයේ, දූනගහ පත්තුවේ, කටාන ප්‍රාදේශීය සභාවට අයත් දෙමංහන්දිය උප කාර්යාල සීමාව තුළ කිඹුලාපිටියෙහි පිහිටි "මෙන්ඩෝරගහවත්ත දෙල්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක වයි. එම්. ආර්. යාපා විසින් 1991 ජූලි මස 20 වැනි දින අංක 1814 දරන පිඹුර ප්‍රකාර ලොට් '2බී' හි ප්‍රමාණයෙන් අක්කර බින්දුවයි, රූඩ් එකයි, පර්චස් දොළහයි දශම බින්දුවයි හතයි පහක් (අ. 0, රූ. 01, පර්. 12.075) විශාල ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි සහ අනිකුත් සියලු දේත් සමග වේ.

මෙම දේපළ නාවල අධිකාරීගේ සීරියස් කුරේරා ණයකරු හැටියට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් පී. එම්. එම්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද, 2007.08.13 වැනි දින සහ අංක 2089 දරන බැඳුම්කරය යටතේ බැංකුවට සුරක්ෂිත කර ඇත.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ 2011.01.14 වන දින පෙ.ව. 11.30ට දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.*- මීගමුව සිට තෙල්වත්ත හන්දිය දක්වා කිලෝමීටර් 1.3 ක් පමණ ගොස් එතැන සිට කිලෝමීටර් 5.2 ක් කිඹුලාපිටිය පාරේ කිඹුලාපිටිය හන්දිය දක්වා යන විට කිඹුලාපිටිය හන්දියට මීටර් 10 කට මෙහායින් පාරේ වම් පැත්තේ මෙම දේපළ පිහිටා ඇත.

යෝජනා සම්මුතිය සඳහා.- වර්ෂ 2010 ක් වූ අප්‍රේල් මස 01 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, දිවයින, ද අයිලන්ඩ් සහ තිනකරන් පුවත්පත් වල වර්ෂ 2010 ක් වූ අප්‍රේල් මස 01 වැනි දින පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය :

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 1% (සියයට එකක්) ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්),
4. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500 ක් සහ සියලුම ප්‍රචාරක වියදම් ද,
5. නොතාරිස් ගාස්තු හා විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 ක් ද,

ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්), වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවා නිම කළ යුතු වේ. එකී ඉතිරි 90% ක මුදල දින 30 ක් ඇතුළත දී නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත. හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකරු (අය කිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479,ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661821, 011-2661835.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සාම විනිසුරු (මුළු දිවයිනටම).

කාර්යාලය : 25 'බී' බෙල්මන්ට් වීදිය, කොළඹ 12.
දුරකථන : 011-5756356, 011-2334808,
071-8760986.

12-841

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මාරවිල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පදිංචියට සුදුසු වටිනා දේපළක්.- වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල සීමාවේ දකුණු පිටිගල් කෝරළයේ මැද පත්තුවේ මුදුන්කටුව ගමේ මකුළුගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක පී. එච්. ඊ. මෙන්ඩිස් විසින් ලියා සහතික කරන ලද 1979.06.27 වැනි දිනැති අංක 4055 පිඹුරට අනුව අක්කර බින්දුවයි, රූඩ් බින්දුවයි, පර්චස් දහතුනයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 13.5) ක් විශාල වූ ඉඩම වේ.

මෙම දේපළ.- වර්ණකුලසූරිය රංජිත් නිශාන්ත ප්‍රනාන්දු ණයකරු හැටියට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් මාරවිල ප්‍රසිද්ධ නොතාරිස් එච්. ජේ. එම්. ඩී. ජයසිංහ විසින් සහතික කරන ලද්දා වූද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද, 2008.10.31 දිනැති අංක 17866 දරන බැඳුම්කරය යටතේ බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.*- මාරවිල ඔරලෝසු කණුව ළඟින් කොළඹ පාරේ මීටර් 800 ක් පමණ ගොස් ඉන් පසුව දකුණට හැරී මීටර් 150 ක් පමණ සමගි මාවතේ ගොස් වමට හැරී මීටර් 25 ක් පමණ අඩි 10 ක් පළල ගුරු පාරේ ගිය විට දකුණු පැත්තේ ඇති ඉඩමට පිවිසිය හැකිය.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2011 ක් වූ ජනවාරි මස 18 වැනි දින පෙ.ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය.- රජයේ *ගැසට් පත්‍රයේ* වර්ෂ 2010 ක් වූ මැයි මස 07 වැනි දින ද, දිවයින අයිලන්ඩ් සහ තිනකරන් පුවත්පත් වල වර්ෂ 2010 ක් වූ මැයි මස 12 වැනි දින පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය.*-විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය :

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්) ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 1% (සියයට එකක්) ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්) ද,
4. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500 ක් සහ සියලුම ප්‍රචාරක වියදම් ද,
5. නොතාරිස් ගාස්තු සහ විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 ක් ද,

ගැනුම් මිලෙන් ඉතිරි 90% ක් වූ (සියයට අනූවක්), විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවා නිම කළ යුතු වේ. එකී ඉතිරි 90% මුදල දින 30 ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත. හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර සඳහා විමසන්න : සහකාර සාමාන්‍යාධිකාරී (අය කිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661821, 2661835.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ තක්සේරුකරු, සාම විනිසුරු
(මුළු දිවයිනටම).

කාර්යාලය : අංක 25 'බී' බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.
දුරකථන : 011-5756356, 011-2334808,
071-8760986.

12-839

## හැටන් නැෂනල් බැංකුව පීඑල්සී - මුතුවැල්ල ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැංකුව පීඑල්සී නමට ලියන ලද්දා වූ ද 2007.11.21 දින සහ අංක 3796 දරන ණය බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මුත්තුසාමි ක්‍රිෂ්ණමූර්ති යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් හා සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තුව ඇතුළත්ව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ, වර්ෂ 2011 ක් වූ ජනවාරි මස 20 වැනි දින ප.ව. 1.30 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර උඩගම්පහ කෝරළයේ කෙන්ගල්ල පිහිටි අංගන්තැන්න එස්ටේට් සහ අංගේතැන්න නොහොත් අංකඳුරේ වත්ත එස්ටේට් නමැති ඉඩමට බලයලත් මානක අයි. විජේකෝන් විසින් පිළියෙල කරන ලද 2006.11.30 දිනැති අංක 531 සී දරන පිඹුරේ ලොට් 3/447 දරන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස වන (මෙය බලයලත් මානක අයි. විජේකෝන් විසින් පිළියෙල කරන ලද 2006.05.01 දිනැති අංක 531 ඒ දරන පිඹුරේ ලොට් 3/404 සිට 3/459 සහ 29 පාර සිට 32 පාර දරන කොටස්හි නැවත මැණුමක් හා උප බෙදුමක් වන අතර එකී කොටස් බලයලත් මානක ජී. බී. දොඩම්වෙල විසින් පිළියෙල කරන ලද 1999.09.12 දිනැති අංක 3244 දරන පිඹුරේ ලොට් 1, 2 සහ 3 දරන කොටස්හි නැවත මැණුමක් සහ උපබෙදුමක් වේ.

*විශාලත්වය :* ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම බිංදුවයි අටක් (අ. 0, රූ. 0, පර්. 8.08) ක් වේ.

වැඩිදුර විස්තර සඳහා.- 2010.05.14 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2010.05.19 දින දිවයින, අයිලන්ඩ් සහ තිනකරන් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම.*-මහනුවර නගරයේ සිට දිගන පාරේ ගමන් කර කුන්ඩසාලේ පසුකර කි. මී. 13.4 ක් පමණ ගිය විට දිගන ගමට පිවිස අනතුරුව අඹකොටේ පාරේ (ශ්‍රී රාහුල මාවත යනුවෙන් ද හඳුන්වනු ලබන) මීටර් 700 ක් පමණ ගමන් කළ විට නිවාස යෝජනා ක්‍රමයට ඇතුළුවන ස්ථානයේ දකුණුපස ඇති, වාහන ගමන් කළ හැකි තාර දමන ලද පාරේ මීටර් 300ක් පමණ ඉදිරියට ගිය විට, බෙන්ජමිනා පටුමගේ දකුණු පස මෙම දේපළ පිහිටා ඇත. (අදාළ දේපළ මීටර් 75 ක සීමාව තුළ පිහිටි කාර්යාල ගොඩනැගිල්ල).

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැනුම්කරුවකු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් සිදුකළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ :

1. වෙන්දේසිය තීන්දු කළ විගස ගැනුම් මිලෙන් 10% ක මුදලක් ද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක බදු මුදල ද,
3. ගැනුම් මිලෙන් 2 1/2% ක් වූ වෙන්දේසිකරුගේ කොමිස් මුදලද,
4. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000 ක් ද,
5. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,000 ක් ද,
6. ප්‍රචාරක වියදම් ද.

ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට ද එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට ද බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාළ ලේඛන පරීක්ෂාකර බැලීමට හා වැඩි විස්තර සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකාර තැන (ණය අයකර ගැනීම්), හැටන් නැෂනල් බැංකුව පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

ශ්‍රියාණි මනම්පේරි,
ප්‍රසිද්ධ වෙන්දේසිකරු, උසාවියේ කොමසාරිස්,
තක්සේරුකරු සහ බ්‍රෝකර්.

අංක 09, බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක : 011-2320074 හෝ 073-151356.

12-838

---

## හැටන් නැෂනල් බැංකුව පීඑල්සී - වත්තල ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හල්ලොළුව විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැංකුව පීඑල්සී නමට ලියන ලද්දාවූ ද 2006.08.02 දින සහ අංක 1710 දරන ණය බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඇස්ට්‍රොලොජි හි පරම අයිතිකරු ලෙස ඌරල ලියනගේ දොන් ජයන්ත ගුණසිංහ යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තුව ඇතුලත්ව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ, වර්ෂ 2011 ක් වූ ජනවාරි මස 17 වැනි දින පෙ.ව. 11.30 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළයේ මැද පත්තුවේ ගම්පහ ප්‍රාදේශීය සභා බල සීමාවට අයත් හෙනරත්ගොඩ ගල්ලොලුව නැදුගමුව පාර පළවන පටුමග වරිපනම් අංක 48 හි පිහිටි මිල්ලගහවත්ත නමැති ඉඩමේ ලොට් අංක 2 දරන ඉඩම් කොටසට බලයලත් මානක ආර්. එල්. ද සිල්වා විසින් 1994.12.01 වැනි දින මැන සාදන ලද අංක 220 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කර සීමා නිර්නය කර ඇති ඉඩම.

*විශාලත්වය* : පර්චස් විසිඑකයි දශම බින්දුවයි පහ (අ. 0, රූ. 0, පර්. 21.05) ක් වේ.

වැඩි දුර විස්තර සඳහා.- 2009.09.03 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2009.09.10 වැනි දින දිවයින, අයිලන්ඩ් සහ තිනකරන් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම.*- කොළඹ නුවර ප්‍රධාන මාර්ගයේ බැලුම්මහර දක්වා පැමිණි පසු දකුණු පසින් හමුවන කඩුවෙල පාරේ (නව නුවර පාර) තවත් කි. මී. 1 පමණ පැමිණි පසු වම්පසින් හමුවන නැඳුන්ගමුව පාරේ කිලෝමීටර් 1/2 පැමිණි පසු අදාළ දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන්වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් සිදුකල යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. වෙන්දේසිය තීන්දු කල විගස ගැනුම් මිලෙන් 10% ක මුදලද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක බදු මුදලද,
3. ගැනුම් මිලෙන් 2 1/2ක් වූ වෙන්දේසිකරුගේ කොමිස් මුදලද,
4. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000 ක් ද,
5. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1000 ක් ද,
6. ප්‍රචාරක වියදම් ද.

ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව පී එල් සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට ද එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට ද බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාළ ලේඛන පරීක්ෂා කර බැලීමට හා වැඩි විස්තර සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකාර තැන (ණය අයකර ගැනීම) හැටන් නැෂනල් බැංකුව පීඑල්සී අංක 479 ටී. බී. ජායා මාවත, කොළඹ 10.

ශ්‍රියාණි මනම්පේරි,
ප්‍රසිද්ධ වෙන්දේසිකරු, උසාවියේ කොමසාරිස්,
තක්සේරුකරු සහ බ්‍රෝකර්.

අංක 09, බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.

12-837

---

## මහජන බැංකුව - කෙසෙල්වත්ත ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල සීමාවට අයත් සියනෑ කෝරලේ අධිකාරි පත්තුවේ ඊරියවැටියේ පිහිටා තිබෙන ගොඩැල්ලහේන මිල්ලගහවත්ත නමැති ඉඩමේ ලොට් 8 දරන කොටස සහ මාර්ග අයිතිවාසිකම් ද සමග වේ.

මහජන බැංකුව විසින් මාවෙත පවරන ලද බලය යටතේ මා විසින් 2011 ජනවාරි 08 වැනි දින, පෙ.ව. 11.30 ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපළ පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2010.11.19 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* ද, 2010.09.13 දිනැති දිනමිණ, ඩේලිනිව්ස් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම*.- කැළණිය සිට කිරිබත්ගොඩ මංසන්ධිය දක්වා ගොස් එතැනින් වම්පසට ඇති කිරිබත්ගොඩ මංසන්ධිය හමුවීමට ප්‍රථම ඊරියවැටිය පාරේ මීටර් 500 ක්පමණ ගිය විට වම්පසට හමුවන දේව සුකත්තාරාම පාරේ පන්සල පසුකර ඉදිරියට මීටර් 500 ක් ගිය විට හමුවන හතරමං හන්දිය පසුකරනවාත් සමග වම්පසට ඇති අතුරු පාරේ දකුණු පසින් පිහිටි අංක 614/එෆ්/1 දරන ස්ථානයේ පිහිටි අදාළ දේපළ වේ.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසියේ අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැනුම් මිලෙන් 10% ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 01% ක්,
3. වෙන්දේසියේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 02 1/2% ක්,
4. ලිපිකරු හා නිවේදක ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැනුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත කොළඹ 01, අංක 11, ආදිපාද වීදියේ, මහජන බැංකුවේ සහකාර ප්‍රාදේශීය කළමනාකරු (කොළඹ උතුර) වෙත ගෙවිය යුතු ය.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැකිය.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් මුදල දින 30 ක් ඇතුළත නොගෙව්වහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

දූරකථන අංක : 2387068, ෆැක්ස් අංකය : 2435977

අර්වින් පෙරේරා,
(සාම විනිසුරු), වෙන්දේසිකරු, උසාවි කොමසාරිස්,
තක්සේරුකරු සහ භාෂා පරිවර්තක.

අංක 03,
පාගොඩ පාර,
නුගේගොඩ.
දූරකථන : 2810145, 0718-021206.

12-844

---

## මහජන බැංකුව - වාද්දුව ශාඛාව

### 1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්දේ, වෑකඩ ග්‍රාමයේ පිහිටි "පණ්ඩිතයා වත්ත" නමැති ඉඩමට බලයලත් මානක වයි. බී. කේ. කොස්තා මහතාගේ 1999.04.25 වැනි දිනැති සහ අංක. 3097 දරන පිඹුරේ "ලොට් ඒ 2ට" හි ප්‍රමාණයෙන් අක්කර බින්දුවයි රූඩ් බින්දුවයි පර්චස් දොළහයි දශම හතරක් (අ. 0, රූ. 0, පර්. 12.4) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි සියලුම ගොඩනැගිලි ගහකොළ පළතුරු ආදී සියලු දේ ද වේ.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2011.01.13 වැනි දින පෙ.ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම*.- කොළඹ - ගාල්ල මහ මාර්ගයේ, පානදුර නගර මධ්‍යයේ පිහිටි වටරවුම අසළින් වම් අතට යන ෆොන්සේකා මාවතේ මීටර් 200 ක් පමණ ඇතින් නැවත වම් අතට යන ප්‍රනාන්දු මාවත හමු

වේ. එම පාරේ මීටර් 200 ක් පමණ දුරින් දකුණු අතට අඩි 10 පාර කෙළවර මෙම දේපළ පිහිටා ඇත. දේපළට වාහනයකින් පිවිසිය හැක. ප්‍රවේශ බාධක නොමැත.

*යෝජනා සම්මුතිය සඳහා.-* රජයේ *ගැසට් පත්‍රයේ* 2010.10.22 වැනි දින ද, දිනමිණ, ඩේලි නිව්ස් සහ තිනකරන් පුවත්පත්වල 2010.10.14 වැනි දින පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැනුම් මිලෙන් 10% ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක් ද,
5. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැනුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත මහජන බැංකුව, ප්‍රාදේශීය කළමනාකරු, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, (කළුතර), අංක 341, ගාළු පාර, පානදුර වෙත ගෙවිය යුතුය. දුරකථන : 038-2232438, 2241596, 4283182, 2235401, 2241469.

ෆැක්ස් අංකය : 038-2232727.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර සඳහන් ලිපිනයෙන් ලබා ගත හැක. ඉහත සඳහන් කරන ලද මුදල් දින 30 ක් ඇතුළත නොගෙව්වහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මිලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු සාම විනිසුරු,
(මුළු දිවයිනටම).

කාර්යාලය : අංක 25 'බී' බෙල්මන්ට් වීදිය, කොළඹ 12.
දුරකථන : 011-5756356, 011-2334808,
නිවස : 11/55, කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකථන : 011-2419126, 071-8760986.

12-840

---

## සෙලාන් බැංකුව පීඑල්සී -කෝපරේට් බෑන්කිං යුනිට් ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකිණීම

#### කෘෂිකාර්මික දේපළක්

මෙම දේපළ නුගේගොඩ ව්‍යාපාර ලියාපදිංචි අංක එන් (පීවීඑස්) 21525 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන "මැල්කෝ ඉන්ජිනියරිං (ප්‍රයිවට්) ලිමිටඩ්" සහ නුගේගොඩ පදිංචි පෙලවාසිගේ අචලා මේරි ලයිස් ඩිලයිලා විජේසිංහ විවාහයට පෙර වාස් යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, බිංගිරිය ප්‍රාදේශීය සභා සීමාව තුළ හිරිපොකුණ ගමේ කරදපොත පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ජී. ෂෙල්ටන් සමරතුංග විසින් සාදන ලද 1992.02.08 දිනැති අංක 3681 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන හිරිපොකුණ නමැති කුඹුරු යායකින් සහ පොල් වගාවකින් යුතු කෘෂිකාර්මික ඉඩම ප්‍රමාණයෙන් අක්කර විසිහතරයි රූඩ් දෙකයි පර්චස් දහසයක් (අ. 24, රූ. 2, පර්. 16) විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපළ 2011 ජනවාරි මස 13 වන දින පෙරවරු 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.-* කුරුණෑගල හලාවත මාර්ගයේ පිහිටි බෝවත්ත මංසන්ධියෙන් වම්පසට ඇති වීරපොකුණ පාරට හැරී කි.මී. 5.4 ක් පමණ ගිය විට (ට්‍රාන්ස්ෆෝමර් එක අසලින්) වම්පසට ඇති බොරළු පාරට හැරී තවත් මීටර් 900 ක් පමණ ගිය විට මාර්ගයේ වම් පස අදාළ දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.-* රජයේ *ගැසට් පත්‍රයේ* 2010.08.06 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2010.07.28 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2010.08.04 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකල යුතුය.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න :* සහකාර සාමාන්‍යාධිකාරී (නීති) සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03, දු.ක 011-2456285, 2456276, 2456284.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක : 011-3068185, 011-2572940.

12-816

---

## කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - මාතර ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බෑන්ක් සිලෝන් පී.එල්.සී. (ලියාපදිංචි අංක පීකිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බලයලත් මානක පී. දහනායක විසින් 1999 සැප්තැම්බර් මස 26 වැනි දින සාදන ලද අංක 1764 දරන පිඹුර පරිදි දකුණු පළාතේ, මාතර

දිස්ත්‍රික්කයේ, කඩවත්සතරෙහි මහනගර සීමාව තුළ වැලිවේරිය රාහුල පාරේ වරිපනම් අංක 106 පිහිටි කඹුරුගමුවගෙවත්ත කියන ඉඩමේ ලොට් B හි බෙදා වෙන් කරන ලද ලොට් B 1, පර්චස් විසි පහයි දශම තුනයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 25.30) නැතහොත් හෙක්ටයාර 0.0640 විශාල ඉඩම සහ ඒ තුල පිහිටි පස්බිම, වගාවන්, ගොඩනැගිලි සහ සියලු දේත් සමග වේ.

සමන්ත ධීරසේකර සහ උණවටුන කොස්වත්තගේ සාගරිකා සමන්ති යන අය විසින් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී ට උකස් කරන ලද ඉහත සඳහන් කල දේපළ, 2011 ජනවාරි මස 24 වන දින පෙ.ව. 11.30 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.12.04 වැනි දින රජයේ *ගැසට් පත්‍රය*ද 2009.12.11 වැනි දින ලක්බිම, වීරකේසරී, සහ ද අයිලන්ඩ් පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳව දැන්වීම සඳහා 2010.12.24 වැනි දින රජයේ *ගැසට් පත්‍රය*ද 2010.12.30 වැනි දින ලක්බිම සහ ද අයිලන්ඩ් පුවත් පත්ද බලන්න.

*ඉඩමට පිවිසීම.*- මාතර නගර මධ්‍යයේ සිට ධර්මපාල මාවත ඔස්සේ ගොස් දකුණත පිහිටි බතුතා පාරට හැරී මීටර් 375 ක් පමණ ගොස් වමට පිහිටි රාහුල පාරට හැරී මීටර් 200 ක් පමණ ගිය විට අදාළ දේපළ දකුණත පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- විකිණීම ස්ථිර කල වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
4. නොතාරිස් ගාස්තුව රු. 2,000,
5. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
7. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුළ දී කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ මාතර ශාඛාවේ තැන්පත් කල යුතුයි.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
අංක 99, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන : 011-3144520,
දුරකථන/ෆැක්ස් : 011-2445393.

කළමනාකරු,
කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී,
අංක 18,
දුම්රියපළ පාර,
මාතර.
දුරකථන අංක : 041-2224443
041-2225666.
ෆැක්ස් අංකය : 041-2224445.

12-789

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

වත්තේගම, ප්‍රධාන වීදියේ අංක 87 දරන ස්ථානයේ පිහිටි "බුහාරි බ්‍රදර්ස්" හි හවුල්කරුවන් වන බුහාරි ඉසදීන් මයා, බුහාරි මීරා මොහිදීන් මයා, බුහාරි අබ්දුල් රහුමාන් මයා, බුහාරි අබ්දුල් කාදර් මයා හා බුහාරි මොහමඩ් ඉස්මයිල් මයා යන අයවළුන් විසින් උකස් කරන ලද දේපොළ

අයිරා යොමුව : 811/2007.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2010.10.01 දිනැති අංක 1674 දරන *ගැසට් පත්‍රයේ* හා 2010.09.23 දිනැති "දිනමිණ", "තිනකරන්", හා "ඩේලි නිවුස්" යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව මුල් මුදලේ ශේෂය ද විකිණීම කරන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය, ගාස්තු සහ එකී ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා පරිශ්‍රය පිහිටි ස්ථානයේ දී 2011.02.18 වැනි දින පෙ. ව. 11.00 ට මහනුවර, ටොරිංටන් පාර අංක 24 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

### උපලේඛනය

